වැල්ලවාය ප්රාදේශීය සභාව - 2023

------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ</u>

### 1.6.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පොදු තැන්පත් ලේඛනයේ ඇතුලත් රු. 153,730 ක තැන්පත් ශේෂ 03 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම නිශ්චිතව හඳුනාගත නොහැකි තොග ලේඛනවල ඇතුලත් වර්ග 06 කට අදාල ලේඛන 110 ක තොග වටිනාකම ඉතිරි තොගය තුල ඇතුලත් කර නොතිබුණි. | මුද්‍රිත තොග ලේඛන පරීක්ෂාකර 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | සියලු වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද රු. 12,095,414 ක් වූ කර්මාන්ත 05 ක නිම්වැඩ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී මිලදී ගන්නා ලද රු.178,900 ක වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද වැල්ලවාය සභා කාර්යාලයේ ලේඛනාගාරය සහ භෝජනාගාරයේ වැඩි දියුණු කිරීම් වෙනුවෙන් දරන ලද පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද TABLET පරිගණක යන්ත්‍රයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (උ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු. 63,500 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 02 ක සහ රු. 92,000 ක් වූ පරිගණක මුද්‍රිත පිටපත් යන්ත්‍රයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපුම් සිදුකර ශේෂ නිවැරදි කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඏ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර ඇති ඩබල් කැබ් රථයේ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර නොතිබුණු අතර භෞතිකවද නොපැවතුණි. | මෙය භෞතිකව කාර්යාලයේ නොමැති වත්කමක් බැවින් වටිනාකම ගිණුම්ගත කළ නොහැකි අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | රථයේ අයිතිය සහ පැවැත්ම නිරවුල් කරගත යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ආදායම රු. 22,973,156 ක් වුවත් එය රු. 22,665,398 ක් ලෙස රු. 307,758 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල ගැලපුම් සිදුකර 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් ශේෂ නිවැරදි කරන බව. | සභාව සතු ආදායම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 16,035,480 ක් වුවත් එය රු. 15,865,930 ක් ලෙස රු. 169,500 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල නිවැරදිකිරීම් සිදුකරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ආදායම ඇස්තමේන්තුකර ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල නිවැරදිකිරීම් සිදුකරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඕ) 2023 වර්ෂයේ මිලදී ගත් පුස්තකාල පොත්වල වටිනාකම රු. 127,871 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල නිවැරදිකිරීම් සිදුකරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 <u>නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා</u>

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------------- | ---------------------------- | ---------------- |
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා ඒ සඳහා ලබාදී ඇති උපලේඛන හා ලේඛන අනුව ශේෂයන් අතර රු. 3,224,267 ක වෙනසක් පැවතුණි. | අදාල තොරතුරු සොයා ලේඛන නිවැරදි කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපලේඛනවල දැක්වෙන ශේෂයන් පදනම්ව පිළියෙල කළ යුතුය. |

### 1.6.3 <u>විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු. 111,822,746 ක් වූ වත්කම් විෂයයන් 10 ක් සම්බන්ධයෙන් තක්සේරුකරුවන්ගේ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන,යාවත්කාලීන කරන ලද ආදායම් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාල ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් ශේෂයන් තහවුරු කිරීමට අදාල ලේඛන සහ උපලේඛන පදනම්ව පිළියෙල කළ යුතුය. |

### 1.7 <u>අනුකූල නොවීම්</u>

<u>**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**</u>

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ) _1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**<br>(i)19 (xii) වගන්තිය | කඩකාමර 60 ක් බදු දීමේ දී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | දීර්ඝකාලින බදුදීම්වලට අදාලව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) 24(1) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රිය ඇතුලත් මාර්ග 191 ක් ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් විෂය නිලධාරි වෙත ලබාදුන් බව. | සභාවේ මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුලත් මාර්ග ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය. | 2016 - 2020 වර්ෂය දක්වා අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත්‍ර 275 ක් අතුරින් ගොඩනැගිලි අයදුම්පත් 214 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අදාල ගොඩනැගිලි පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | සභා බලප්‍රදේශයේ සිදුකරන ඉදිකිරීම් සම්බන්ධයෙන් නියාමනය කළ යුතුය. |
| (ඇ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන සහ යන්ත්‍ර 09 ක රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම පින්තාරු කර නොතිබුණි. | සභාව සතු සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම පින්තාරු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | වීථි පහන් ලේඛනය අනුව, වීථි පහන් 2000 ක් සවිකර තිබුණද, වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | ඉදිරියේදී ගිවිසුම්ගතවීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,463,209 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,240,661 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම<br><br>රු. | බිල් කළ ආදායම<br><br>රු. | රැස්කළ ආදායම<br><br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br><br>රු. | බිල් කළ ආදායම<br><br>රු. | රැස්කළ ආදායම<br><br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 6,265,905 | 6,194,521 | 1,709,005 | 4,485,516 | 6,246,032 | 6,092,873 | 2,037,152 | 3,862,439 |
| (ii) | කුලී | 17,812,000 | 12,707,108 | 10,121,259 | 2,585,849 | 15,116,000 | 10,264,672 | 5,445,948 | 4,832,094 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 19,701,025 | 2,116,978 | 2,107,978 | 9,000 | 6,361,025 | 2,201,106 | 2,156,106 | 45,000 |
| (iv) | වෙනත් ආදායම් | 51,323,500 | 34,227,057 | 17,889,065 | 16,337,992 | 2,987,000 | 1,755,755 | 483,272 | 1,272,483 |
| | **එකතුව** | -------------<br>95,102,430<br>======== | -------------<br>55,245,664<br>======== | -------------<br>31,827,307<br>======== | --------------<br>23,418,357<br>========= | -------------<br>30,710,057<br>======== | --------------<br>20,314,406<br>======== | -------------<br>10,122,478<br>======== | -------------<br>10,012,016<br>======== |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය**<br>------------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>------------------------------- | **නිර්දේශය**<br>---------------- |
|---|---|---|
| <u>**වරිපනම් හා බදු**</u><br>(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 5,860,614 ක් වූ වරිපනම් බදු ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 4,026,022 ක් හෙවත් සියයට 69 ක් අයකරගෙන නොතිබුණි. | අයකරන බදු හිඟ මුදල සඳහා හිලව් කරන බැවින් ප්‍රවර්ථන අයවීම පහත මට්ටමක පවතින බව. | බිල්කළ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 18,319,443 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් රු. 16,573,262 ක් හෙවත් සියයට 90 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂක තනතුර පුරප්පාඩුව පවතින බැවින් ආදායම් අයකිරීම පහත මට්ටමක පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ටෙන්ඩර් දේපල 8 ක් බදු දීමට අදාලව සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 5,057,329 ක දේපල බදු ආදායමෙන් රු. 502,916 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් අයකරගත යුතුය. |
| (ඇ) 2018 වර්ෂයට පෙර සිට සහ 2019 සිට 2023 වර්ෂය දක්වා සභාව සතු දේපල 13 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 6,933,148 ක කුලී ආදායම අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**කුලී**

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 4,916,548 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 1,934,709 ක් හෙවත් සියයට 40 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | ප්‍රවර්ථන අයවීම් හිඟ කුලී සඳහා හිලව් කිරීම හේතුවෙන් ප්‍රවර්ථන අයවීම පහත මට්ටමක පවතින බව. | බිල්කළ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 8,342,408 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් වර්ෂය තුලදී රු. 6,223,070 ක් හෙවත් සියයට 74 ක ප්‍රමාණයක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| (අ) සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු ආයතන 04 කට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08 කින් 2019-2023 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 54,000 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2013 -2021 කාල පරිච්ඡේදයට අදාලව සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් පාර්ශව 22 කින් අයවිය යුතු රු. 1,674,870 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 14 ක් වෙනුවෙන් 2017-2022 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 326,550 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 10,232 ක් සහ මුද්දර ගාස්තු රු. 14,468,254 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**පරිසර ආරක්ෂණ බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර නිකුත් කළ පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාල | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව. | සභා බලප්‍රදේශයේ පවත්නා ව්‍යාපාර හා කර්මාන්ත නියාමනය කළ යුතුය. |

සීමාව අවසන් වූ කර්මාන්ත 50 ක් සඳහා නැවත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා වන මාර්ගෝපදේශයේ 2.5.2 වගන්තිය අනුව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව ලෙස අයකරනු ලබන මුදල් බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පවත්වා නොතිබුණි. | වෙනම ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) සභාවට අයත් පුස්තකාල 03 ක ඉකුත් වර්ෂයන්වලදී පාඨකයින්ට ලබාදී තිබුණු රු. 31,349 ක් වටිනා පුස්තකාල පොත් 137 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පොත් ගෙන්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බව. | පාඨකයන් වෙත ලබා දුන් පොත් නැවත ලබාගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ II වන කොටසේ 23(1) වගන්තිය අනුව තෙළුල්ල ප්‍රදේශයේ අනු බෙදුම් කළ අක්කර 45 ක ඉඩමෙන් සභාවට ලැබිය යුතු ඉඩම් කොටස වෙන්කර ගෙන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදී ඇති බව. | සභාවට ලැබිය යුතු ඉඩම් කොටස විධිමත්ව වෙන්කර සභාව වෙත පවරාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) හා (2) වගන්ති අනුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත වෙන්දේසි කරන ඉඩමක, එම ඉඩම විකිණීමෙන් ලද මුදලින් සියයට 1 කට සමාන බද්දක් ප්‍රාදේශීය සභාවට අයකරගත යුතු නමුත් වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්දේසි කරන ලද ඉඩම් කැබලි 694 කට අදාලව බදු මුදල් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රාදේශීය සභා පනත අනුව අදාල බදු මුදල් අයකරගත යුතුය. |
| (ඇ) කඩ කුලී තක්සේරු කිරීමකින් තොරව සභාව සතු කඩ කාමර 37 කින් මසකට රු. 200 සිට රු. 1,000 දක්වා වූ කඩ කාමර කුලී අයකරමින් පැවතුණි. | කඩ කාමර කුලී සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | කඩ කාමර කුලිය කාලීනව තක්සේරු කර අයකළ යුතුය. |
| (ඈ) ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පොළ කඩ කාමර 32 ක සහ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 42 ක කඩ කාමර කුලී 2011 සහ 2015 වර්ෂවලදී තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කරගෙන තිබුණු අතර කාලීනව තක්සේරුකිරීම් සිදුකරගෙන නොතිබුණි. | කඩ කාමර කුලී සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | කඩ කාමර කුලිය කාලීනව තක්සේරු කර අයකළ යුතුය. |
| (ඉ) ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 15 ක් බදුදීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම්ගතවී නොතිබුණු අතර ඉන් කඩ කාමර 11 ට අදාලව වාර්ෂිකව බිල් කිරීම් සිදුකලද කිසිදු ආදායමක් රැස්කරගෙන නොතිබුණි. | කඩ කාමර බදුදීමට අදාලව ගිවිසුම්ගත වීමට කඩ බදුකරුවන් ලිඛිතව දැනුවත් කර ඇති බව. | සභාව සතු දේපල බදු දීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතු අතර බිල්කළ ආදායම රැස්කළ යුතුය. |

## 3.4 <u>වත්කම් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභාව විසින් පාලනය කරනු ලබන යාලබෝව හරිත උද්‍යානය පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ඉල්ලීම් මේ වන විට සිදුකර ඇති බව. | සභාව විසින් පරිහරණය කරන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) බැකෝලෝඩර් යන්ත්‍රය 2021 අගෝස්තු 17 දින අනතුරට ලක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදු කරන බව. | වාහන සහ යන්ත්‍රවල අලුත්වැඩියාවන් අදාල කාල සීමාවන්වලදී සිදුකළ යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාවට අයත් වාහන 02 ක් වසර 12 ක කාලයක සිට අක්‍රීයව පවතින අතර එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණයට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | කාලීනව වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන බව. | සභාව සතු වාහනවල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගත යුතුය. |
| (ඉ) ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් 04 ක හා සුසාන භූමි 77 ක වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | ඉඩම් හා සුසානභූමි මැනුම් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය පියවර ගෙන ඇති බැවින් මැනුම්පත් ලද වහාම තක්සේරු කිරීමට කටයුතු කරන බව. | සභාව සතු ඉඩම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව සේවකයින් 07 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සභාවේ සේවය කළ සේවකයින් 53 දෙනෙකුට අදාලව අයවිය යුතු රු. 135,597 ක ණය ශේෂ 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් සේවක ණය අයකිරීමට කටයුතු කරන බව. | සේවක ණය ශේෂ කාලීනව අයකර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 0.8 සිට සියයට 89 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 29 සිට සියයට 95 දක්වාද විචලනයන් පැවතුණි. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.2 පාරිසරික ගැටලු

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් ගලි සේවාව හරහා බැහැර කරනු ලබන මල අපද්‍රව්‍ය ආනපල්ලම කොම්පෝස්ට් අංගනයේ විවෘත වලකට බැහැර කිරීම හේතුවෙන් වර්ෂාවත් සමඟ එම වල උතුරා යන බව නිරීක්ෂණය විය. මල අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාලව සභාව විසින් මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | විධිමත්ව මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් මෙම ගැටළුව විසඳීම සඳහා මේ වන විටත් පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කර ඇති බව. | මළ අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත්ව සිදුකළ යුතුය. |

## 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගත යුතුය. |